


## ගොවිකම නඟනා පොතපත වරුණා

# ඇඳිහැරය

**එදා මෙදාතුර අමුඩය සරුවාලයටත් සරුවාලය ඩෙනිමට හා බොටමටත් මාරු වී ඇත. නඟුලට දෑකැත්තට හා අම්බරුවන්ට තිබූ පිළිගැනීම අද ට්‍රැක්ටරයට බූතයාට හා සුනාමියට හිමිව තිබේ . . . .**

ගොවියාගේ ඇඳුම විස්තර කල අගනුවර බාලිකා විදුහලක අපූරු ඉස්කෝලේ මහත්මයෙක් ගැන කතන්දරයක් දැනට දශක කීපයකට පෙර අපි අසා ඇත්තෙමු. තවදුරටත් අමුඩය අන්දවා ඔටුණු පළඳවා රජ කරවන කතා වලට ගොවියා රැවටුණු යුගය අහෝසි වන ලකුණු පෙනෙන්නට තිබේ.

නුවරකලාවියේත් ඈත පිටිසර වන්නිහත්පත්තුවේ කෙලවරේත් තණමල්විල කතරගම පැත්තේ හා ලංකාව හතරවටේ ගොවි මහත්වරු දිනපතා එළවළු මිල දැනගන්නේ අන්තර්ජාලය භාවිතයෙනි. මාධ්‍ය නිසා ඔවුන්ගේ දැනුම් සම්භාරය වැඩිවී තිබේ.

තවද පළපුරුද්දෙන් වගා කරන ගොවිමහතුන්ට වගාවන් පිළිබඳ උපදෙස් වුවමනා නැති බවත් වගා කරන කෙනෙකුට දෙන්නට තරම් උපදෙස් ඔවුන් සතුව ඇති බවත් ඇතම් අය අදහස් කරති. කෙසේ වෙතත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් වගාවන් පිළිබඳව විවිධ පර්යේෂණ තුලින් ලබාගත් තොරතුරු ද නිළධාරීන් හා ගොවියන්ගේ අත්දැකීම් වලින් ලබාගත් තොරතුරු ද ඇතුලත් කොට වගාවන් පිළිබඳ ලියැවුණු පොත් වර්ග 100 කට අධික ප්‍රමාණයක් මේ වන විට මුද්‍රණය කර තිබේ.

ගොවිතැන පිළිබඳව ගොවිමහතුන්ගේ දැනුම වැඩිකිරීමට ව්‍යාපෘති නිළධාරී මහතුන් විසින් කෙලින්ම ලබාදෙන උපදෙස් වටිනාකමින් වැඩි වුවත් ඊට විකල්පයක් ලෙස මුද්‍රිත මාධ්‍ය වලින්ද සැලකිය යුතු මෙහෙයක් ඉටුකිරීමට සමත් වී ඇති බව පිළිගත යුතුව ඇත.


උදාහරණයක් ලෙස පළපුරුද්දෙන් මිරිස් වවන ගොවි මහතෙකු විසින් මිරිස් වගාව පොතේ ඇති තොරතුරු අනුගමනය කිරීමෙන් එක් කන්නයකදී මිරිස් කිලෝ දෙකකින් තම අස්වැන්න වැඩි කරගැනීමට සමත්වූයේ නම් වැඩිවන අස්වනු ප්‍රමාණය අප රටේ ජාතික නිෂ්පාදනයට දායක වන බව සියළුදෙනා පිළිගත යුතුව ඇත.

එම විශ්වාසය පෙරදැරි කරගෙන කෘෂිකාර්මික බෝගයන් ගැන ලියැවුණු පොත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින්

මුද්‍රණය කිරීමට කටයුතු කරවන අතර තොරතුරු හා සන්නිවේදන අංශයේ ප්‍රකාශන ඒකකයට අයත් මුද්‍රණාලය මඟින් එම සියළු ප්‍රකාශන මුද්‍රණය කිරීමට කටයුතු කරනු ලබයි. ඒ තුළින් අවුරුද්දකට රුපියල් විසිපන්ලක්ෂයකට වැඩි වටිනාකමින් යුතු ගොවිතැන ගැන ලියැවුණු පොත් ගොවි ජනතාව අතරට යැවීමට හැකිව තිබෙන අතර ඒවායේ අඩංගු තොරතුරු ජාතික කෘෂිකර්ම නිෂ්පාදිතය ඉහල නැංවීමට නිහඬවම දායකත්වය සපයයි. එහි වටිනාකම- මුදලින් තක්සේරු කළ නොහැකිය.

ඔබ දැන් කියවන ගොවිකම් සඟරාව ද නිර්මාණය කර මුද්‍රණය කරන්නේ කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මඟින් වන නිසා මෙවර ගොවිකම් සඟරාවෙන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ පොතපත මුද්‍රණය කරන කෘෂිකර්ම මුද්‍රණාලයත් එහි වැඩ කරන හැටි ගැනත් කරුණු ඉදිරිපත් කරන්නේ ඔබ සියළුදෙනාගේ දැනගැනීම සඳහායි.

කෘෂිකර්ම මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු පිළිබඳව සම්පූර්ණ වගකීම දරන්නේ මුද්‍රණාල නියාමක ඩී.ඒ. සුනිල් දිසානායක මහතායි. ඔහු වසර තිහකට ආසන්න කාලයක් කෘෂිකර්ම මුද්‍රණාලයට



ඩී.ඒ. සුනිල් මහතා

සම්බන්ධව සේවය කරනවා. පොත්පත් මුද්‍රණය කිරීම පිළිබඳ ඔහු මෙසේ පැහැදලි කළා.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය ආරම්භ කලේ 1982 වසරේදී. ඒ කාලයේ හිටපු අධ්‍යාපන හා පුහුණු අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. නටේසන් මහතාගේ මෙහෙයවීම මතයි. මුද්‍රණාලයේ කටයුතු භාරව ප්‍රකාශන අංශයේ අධිපතිධූරය දැරුවේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ එස්. සුන්දරමූර්ති මහතායි. මුද්‍රණාල අධිකාරිවරයකු යටතේ පාලනය වූ මෙහි ස්ථිර කාර්යය මණ්ඩලය 15 දෙනෙක්ගෙන් පමණ සමන්විත වුනා.

මුල් කාලයේ දී මුද්‍රණය කලේ ගොවිකම් සඟරාව ඇතුළු කෘෂි ප්‍රකාශන කීපයක් පමණක් වූ අතර ඒවාද වැඩිපුර තනි වර්ණයෙන් මුද්‍රණය වුනා.


අද වන විට කෘෂිකර්ම මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු විශාල දියුණුවකට භාජනය වී තිබෙනවා. අද පරිගණක අකුරු ඇමිණීම හෙවත් කම්පියුටර් ටයිප් සෙටින් සහ පරිගණක පිටු සැකසීම හෙවත් කම්පියුටර් පේජ් මේකිං යන ක්‍රම දැනට භාවිතා වෙනවා. මෙහිදී ඇඩොබ් පොටෝෂොප්, ඉන්ඩිසයින් සහ කොරල් ඩ්‍රෝ වැනි මෘදුකාංග භාවිතා කරගැනෙනවා. ඒ අනුව පරිගණක භාවිතයෙන් සකස් කරන ලද මුද්‍රණ කාර්යයට අදාළ සංයුක්ත තැටියක් සහ පරිගණකයෙන් ලබාගත් මුද්‍රිත මුල් ආකෘති පිටපතක් අවශ්‍ය වෙනවා.

අපවෙත ලබාදුන් මුද්‍රණ ආකෘති පිටපත අනුව මුලින් ම සිදුකෙරෙන්නේ මුද්‍රණ කාර්යය සැළසුම් කිරීමයි. සැළසුම් කිරීමේදී මුද්‍රණය කරන්නේ කුමක්ද කිනම් ප්‍රමාණයක් ද කුමන කඩදාසි වර්ග වලද යන්න විමසා බැලෙනවා. ඒ අනුව මුද්‍රණයට අදාළ මුල් අකෘති පිටපතක් නිර්මාණය කෙරෙනවා.

මීළඟට සිදුවන්නේ මුද්‍රණ කාර්යයට අදාළ පොසිටිව්පත් සාදාගැනීමයි. එම කාර්යය සිදුකරනු ලබන්නේ පිළිගත් බාහිර

ආයතනයකින්. පොසිටිව් සෑදීමේදී වර්ණ විභේදන ක්‍රියාවලියද සිදුකරනු ලබනවා.

එසේ සාදාගත් පොසිටිව්පත් නියමිත සැළසුමකට අනුව ලෝහමය ප්ලේට් තහඩු වල පිටපත් කරගැනීම සිදුකෙරෙනවා මෙ සඳහා ප්ලේට් මේකර් යන්ත්‍රය භාවිතා කෙරෙන අතර එම කාරයය සම්පූර්ණ වීමට මුද්‍රණ රසායන ද්‍රව්‍ය ද යොදාගන් ලබනවා. මෙම වැඩ කොටස් නිමකර දෙන්නේ සුදත් කරුණාරත්න මයා සහ අනූෂා හේරත් මහත්මියයි.



ප්ලේට් මේකර් යන්ත්‍රය

මීළඟට ලෝහමය ප්ලේට් තහඩු මුද්‍රණ යන්ත්‍රයට සවිකරනු ලබනවා. ප්ලේට් තහඩු වල පිටපත් කර මුද්‍රණය කිරීමේ ක්‍රමය ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමය ලෙස හඳුන්වනවා. අපේ මුද්‍රණාලයේ ඕෆ්සෙට් වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 3 ක් භාවිතා කෙරෙනවා.

මෙම මුද්‍රණ යන්ත්‍රය ජර්මනියේ නිෂ්පාදිත නවීන හයිඩිල්බර්ග් ප්‍රින්ට් මාස්ටර් මුද්‍රණ යන්ත්‍රයක්. වර්ණ මුද්‍රණයක් සිදුකිරීම සඳහා එක් කඩදාසියක් දෙවරක් යන්ත්‍රයට ඇතුල් කළ යුතු නිසා එම යන්ත්‍ර මාදිලිය ද්වි වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ලෙස හඳුන්වනවා. මෙම යන්ත්‍රය ක්‍රියා කරවන්නේ යූ.ජී.එම්. ගුණවර්ධන මහතායි. ඔහුට සහයට මලින්ද ගජනායක සහ තරංග සමරකෝන් යන මහත්වරු කටයුතු කරනවා.




හයිඩිල්බර්ග් ප්‍රින්ට් මාස්ටර් මුද්‍රණ යන්ත්‍රය




සිවා මුද්‍රණ යන්ත්‍රය

මෙම මුද්‍රණ යන්ත්‍රය ඉන්දියාවේ නිෂ්පාදිත සිවා වර්ගයේ තනි වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක්. සනී ග්‍රෙගරි මහතා මෙම යන්ත්‍රය භාරව කටයුතු කරන අතර නිර්මල් අනුරාධ සහ සුජන්ත අභයධර්ම යන මහතුන් ඔහුට සහය වෙනවා.



මෙම යන්ත්‍රය ජර්මනියේ නිෂ්පාදනය කරන ලද ගෙස්ටෙට්නර් වර්ගයේ කුඩා ප්‍රමාණයේ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයක් වසර විසිගණනක් පැරණි වුවත් තවමත් ක්‍රියාකාරී තත්වයේ පවතිනවා. උපාලි රූපස්සර මහතා මෙම යන්ත්‍රය බාරව කටයුතු කරනවා.

ඉහත මුද්‍රණ යන්ත්‍ර වලට අමතරව අනු පිටපත් ලබාගත හැකි ඩිජිටල් වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර දෙකක් භාවිතා කෙරෙනවා.



ඩිජිටල් වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය

මුද්‍රණය කරන ලද කඩදාසි මීළඟට යැවෙන්නේ පොත් බැඳීමේ අංශයටයි. කලින් සකස් කරගනු ලැබූ මුද්‍රණ ආකෘති පිටපත අනුව කඩදාසි නැවීම හා එකලස් කිරීම මෙහි මුල් පියවරයි.

මේ සඳහා කඩදාසි නවන යන්ත්‍රයක් කෘෂිකර්ම මුද්‍රණාලය සතුව තිබෙනවා. මෙම අංශය පොත් බැඳුම්කරු ඒ.පී.කේ. මහින්ද මහතාගේ මූලිකත්වයෙන් පවත්වාගෙන යනවා.



කඩදාසි නවන යන්ත්‍රය

නාලිකා, චන්ද්‍රිකා, කුසුම්, තමරා, මලීෂා නන්දනී, නිරෝෂා, අනුෂ්කා, හංසිකා සහ දීපිකා යන සොයුරියන් සහයක වරියන් ලෙස සේවය කරනවා.



පොත් බැඳුම් අංශය





මීළඟ පියවර වන්නේ මුද්‍රිත ද්‍රව්‍ය කට්ටල් කිරීමයි. ඒ සඳහා කට්ටල් කරීමේ යන්ත්‍රක් අප සතුව තිබෙනවා. තෙන්නකෝන්, මද්දුමබණ්ඩා සහ නිමල් බණ්ඩාර යන මහතුන් මෙම කටයුතු වලට දායක වෙනවා. අවසාන පියවර වන්නේ කට්ටල් කරන ලද මුද්‍රිත ප්‍රකාශන ලේඛණගත කොට විධිමත්ව ප්‍රකාශන තොග ගබඩා-වට බාරදීමයි. ඒ අනව ඉහත සඳහන් කල ආරාරයට මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු සිදුකරනු ලබනවා.



ඉහත සඳහන් කළ මුද්‍රණ යන්ත්‍ර වලට අමතරව කෘෂිකර්ම මුද්‍රණාලය සතුව කඩදාසි කපන යන්ත්‍ර දෙකක් තිබෙනවා. එක් යන්ත්‍රයක් ජර්මනියේ නිෂ්පාදිත තාක්ෂණයෙන් උසස් නවීන ඉලෙක්ට්‍රොනික් යන්ත්‍රයක් වන අතර අනෙක් යන්ත්‍රය චීනයේ නිෂ්පාදිත එකක්. මෙම කඩදාසි කපන යන්ත්‍ර භාවිත කර මුද්‍රණ ඇණවුමට අදාල වන පරිදි කඩදාසි කපාගැනීමත් මුද්‍රණයෙන් පසු ප්‍රමිතියට අනුකූල වන පරිදි මුද්‍රිත ප්‍රකාශන කපා සැකසීමත් සිදු කරනු ලබනවා.



කඩදාසි කපන යන්ත්‍රය



අංක මුද්‍රණ යන්ත්‍රය

මෙම යන්ත්‍රය මගින් අවශ්‍ය වූ විටකදී මුද්‍රණ කාර්යයක අංක මුද්‍රණය කිරීම සිදු කෙරේ. මෙම මුද්‍රණ යන්ත්‍රය මුද්‍රණාලයේ ඇති පැරණිතම මුද්‍රණ යන්ත්‍රයයි.

කෘෂිකර්ම මුද්‍රණාලය අයිතිවෙන්නේ කෘෂිකර්ම ප්‍රකාශන අංශයටයි. එහි පාලන කටයුතු සිදුකරන්නේ තොරතුරු සන්නිවේදන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. පෙරියසාමි මහතා විසිනුයි. ගොවිකම් සඟරාවට ඔහු මෙසේ අදහස් පලකළා.

මෙම ආයතනය මගින් ජාතික වශයෙන් වැදගත් වූ සේවාවක් ඉටුකරනුලබනවා. ගොවිතැනට අදාළ ප්‍රකාශන රචනය සංස්කරණය හා යාවත්කාලීන කිරීම සහ ඒවා මුද්‍රණය කිරීම මෙන්ම කෘෂි ප්‍රකාශන බෙදාහැරීම යනාදිය ඒ අතර වෙනවා. මේ වනවිට දිවයින පුරා ස්ථාන 35 කට අධික අලෙවිසැල් ප්‍රමාණයක කෘෂි ප්‍රකාශන අලෙවි කෙරෙනවා.

එම සියළු කටයුතු කටයුතු සාර්ථක වීමට හේතුවී ඇත්තේ කෘෂිකර්ම මුද්‍රණාලයේ කාර්යය මණ්ඩලයේ සියළු නිලධාරින්ගේ හා සේවක පිරිසකගේ එකමුතුකම සහ කැපවීම මත බව කීම අතිශෝක්තියක් නොවේ. එබැවින් ඔවුන්ගේ නිහඬ සේවයට අප සැමගේ කෘතඥතාවය හිමිවිය යුතුයි...

සුදස්සං වජ්ජං අඤ්ඤෙසං
අත්තනො පන දුද්දසං
පරෙසං හි සො වජ්ජානි
ඔපුණාති යථාභුසං
අත්තනො පන ඡාදෙති
කලිංව කිතවා සඨො

**අනුන් වරද පහසුවෙන් දුටුව හැකිය. තමන්ගේ වරද දැකීම එතරම් පහසුනොවේ. අනුන්ගේ වැරදි සොයන්නා ඒවා දහයියා මෙන් පොලා පෙන්වයි. කොල අතු වලින් තම නිරුවත මුවා කරගන්නා වැද්දකු මෙන් ඔහු වරද වසාලයි.**

ධම්ම පදය (බාල වග්ග)